# UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
# CENTER FOR DISTANCE & CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය 2017**

**(2017 දෙසැම්බර්)**

**ඉතිහාසය II (HG 2)**

**ක්‍රි. ව. 320 සිට 1707 දක්වා උතුරු ඉන්දියාවේ ඉතිහාසය**

කාලය පැය 03 යි.

එක් කොටසකින් යටත් පිරිසෙයින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි ඔබේ පිළිතුර දළ සිතියම් මගින් පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දොළහ (12) කි.

---

**පළමුවැනි කොටස**

1. "ගුප්ත අධිරාජ්‍යයේ බලය නිසිලෙස තහවුරු කරන ලද්දේ පළමුවැනි චන්ද්‍රගුප්ත විසිනි." මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.
2. ගුප්ත අධිරාජ්‍යයේ පැවති ඉඩම් භුක්ති ක්‍රමයේ මුඛ්‍ය ලක්ෂණ විභාග කරන්න.
3. "හූණ ආක්‍රමණ ගුප්ත අධිරාජ්‍ය පරිහානිය කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කිරීමට සමත් නොවීය." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

**දෙවැනි කොටස**

4. පාල යුගයේ ආරම්භය තෙක් ශශාංක යටතේ කනෞජයේ හා බෙංගාලයේ දේශපාලන ඉතිහාසය කෙටියෙන් සාකච්ඡා කරන්න.
5. "හියුංත්සාන්ගේ පක්ෂග්‍රාහී විස්තරය හේතුකොට ගෙන හර්ෂවර්ධනට ඉන්දීය ඉතිහාසයේ අනවශ්‍ය වැදගත්කමක් හිමි වී තිබේ." විවේචනාත්මකව සාකච්ඡා කරන්න.
6. ගුර්ජර ප්‍රතිහාර පාලන සමයේදී සාමන්තවරුන්ගේ භූමිකාවේ වැදගත්කම පරීක්ෂා කරන්න.

## තුන්වන කොටස

7. සඡ්ණී මොහොමඩ්ගේ සහ සූර් මොහොමඩ්ගේ කාර්ය සාඵල්‍ය විවේචනාත්මකව සංසන්දනය කරන්න.
8. දිල්ලි සුල්තාන් රාජ්‍යයේ දේශපාලන වර්ධනයට ඉල්තුත්මිෂ්ගේ දායකත්වය පැහැදිලි කරන්න.
9. දිල්ලි සුල්තාන් රාජ්‍යයේ පරිපාලන සංවිධානයෙහි දක්නට ලැබුණු ප්‍රධාන අංග විචාරාත්මකව විභාග කරන්න.

## හතරවැනි කොටස

10. මුස්ලිම්වරුන් හා හින්දූන් අතර සාමය හා සහජීවනය සඳහා ඖරංෂෙබ්ගේ දායකත්වය ප්‍රමාණ කරන්න.
11. මූගල් යුගයේ  කලා හා ගෘහ නිර්මාණ ශිල්පයේ වර්ධනය විභාග කරන්න.
12. මූගල් යුගයේ ආර්ථික කටයුතු පිළිබඳව විචාරාත්මක රචනයක් ලියන්න.